பிரதிப் பிரதம செயலாளர் அலுவலகம் (நிருவாகம்) - கிழக்கு மாகாணம்
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය (පරිපාලන) - නැගෙනහිර පළාත
OFFICE OF THE DEPUTY CHIEF SECRETARY (ADMINISTRATION) - EASTERN PROVINCE

எனது இல. / මගේ අංකය. / My No. } EP/02/Circular/2017

உமது இல. / ඔබේ අංකය. / Your No. }

திகதி. / දිනය. / Date: } 2017.05.08

චක්‍රලේඛ අංක : DCS(A)01/2017

ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

<u>නැගෙනහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම සඳහා සහන කාලයක් ලබා දීම.</u>

2004.01.01 දින සිට 2013.12.11 දින දක්වා කාලසීමාව ඇතුලත පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට පත්වූ සහ එම කාලය තුළ II වන ශ්‍රේණියට උසස්වීම් ලැබූ නිලධාරීන් සඳහා වූ කායක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම සඳහා ඔවුනගේ පත්වීමේ/උසස්වීමේ දින සිට ඉදිරියට පවත්වන ලද අනුයාත විභාග අවස්ථා (06ක්) දක්වා සහන කාලයක් පහත සඳහන් විධිවිධානයන්ට යටත්ව ලබා දීමට නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කර ඇති බව මෙයින් දන්වමි.

02. මීට පෙරාතුව එම නිලධාරීන් සඳහා පොදුවේ අනුයාත විභාග අවස්ථා හතරක (04ක) සහනයක් පමණක් ලැබී තිබූ අතර ඊට පසුව පැවැති විභාග අවස්ථාවකදී කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වූ විට, වැටුප් වර්ධකය විලම්භනය කරන ලදී එහෙත් ඉහත සහනය හේතුවෙන් අනුයාත විභාග අවස්ථා (06ක්) දක්වා වැටුප් වර්ධක විලම්භනය වීමකින් තොරව III ශ්‍රේණියට සහ II වන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීමට / සම්පූර්ණ කර ගැනීමට නිලධාරීන්ට අවස්ථාව හිමි වන බැවින් එම සහන කාලයට අදාල වැටුප් වර්ධක උපයා ගැනීමට මෙමගින් අවස්ථාව හිමි වනු ඇත.

03. ඉහත 02 ඡේදයේ දැක්වූ පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම ප්‍රමාදවීම මත වැටුප් වර්ධක විලම්භනය වීම හේතුවෙන් ;

I. නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 97 වැනි වගන්තිය යටතේ පරිවාස කාලය දීර්ඝ කර ඇති III ශ්‍රේණියේ නිලධාරීන්ද

II. II වන ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වීමට නොහැකි වූ නිලධාරීන්ද සහ

III. ඉහත හේතු මත සාමාන්‍ය කාර්ය සාධනය අනුව වූ II වන ශ්‍රේණියේ සහ I වන ශ්‍රේණියේ උසස්වීම නියමිත කාලයට වඩා ප්‍රමාද වී ලැබී ඇති නිලධාරීන්ද

මේ යටතේ සිය විලම්භනය වූ වැටුප් වර්ධක සහ ඒ හේතුවෙන් ප්‍රමාද වූ සාමාන්‍ය කාර්ය සාධනය අනුව වූ II වන සහ I වන ශ්‍රේණියේ උසස්වීම් (2004.12.24 දිනැති සේවා ව්‍යවස්ථාවේ 11.3 සහ 12.3 වගන්ති යටතේ සඳහන්) <u>පමණක්</u> යථාවත් කර ගැනීම සඳහා සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයද සහිත ඉල්ලීමක් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

7317

கன்னியா வீதி, வரோதய நகர், திருகோணமலை.
කන්නියා පාර, වරෝදය නගර්, ත්‍රිකුණාමලය.
Kanniya Road, Varothaya Nagar, Trincomalee.

Gen. Office I : 026 2224049
Gen. Office II : 026 2222114
Admin Officer : 026 3269885

Deputy Chief Secretaty : 026 2222703
Assistant Chief Secretaty I : 026 3269883
Assistant Chief SecretatyII : 026 2222593

Fax : 026 2227161
Web : www.ep.gov.lk
E-mail : admin@ep.gov. lk

04. මෙය අතීතයට ද බලපාන පරිදි සිදු කරනු ලබන සහන සැලසීමක් වන හෙයින් පහත සඳහන් කරුණු/ අතීතයේදී අහිමි වූ අවස්ථා පිළිබඳ කිසියම් පිළියමක් වර්තමානයේදී යෙදිය නොහැකි හෙයින්ද එවැනි කරුණුවලදී ගත් අතීත ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි කටයුතු කළ යුතු හෙයින් ද ඒ පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බැලීමට අවකාශ නොමැති බව අවධාරණය කරමි.

I. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය හේතුවෙන් අහිමි වූ වෙනත් සේවාවන්ට පිවිසීමට හෝ උසස්වීම් (2004.12.24 දිනැති සේවා ව්‍යවස්ථාවේ 11.2 සහ 12.2 වගන්ති යටතේ සඳහන් ) සඳහා වූ හෝ තරඟ විභාගයන්ට / සම්මුඛ පරීක්ෂණයට හෝ එවැනි කිසියම් තෝරා ගැනීමක් වෙනුවෙන් වූ අවස්ථාවක් සඳහා පෙනී සිටීමේ අවස්ථාවක් අහිමිවීම පිළිබඳ සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා.

II. මෙම සහන හිමි වීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය හේතුවෙන් අහිමි වූ තනතුරු ලැබීමේ අවස්ථාවන් පිළිබඳ සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා

III. මෙම සහන හිමි වීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනයවීම හඳුනා නොගෙන/ නොසලකමින් සාවද්‍ය ලෙසින් උසස්වීම් හෝ වෙනයම් තරඟ විභාගයන්ට අයදුම්කර ඉන් සමත්ව සම්මුඛ පරීක්ෂණයේදී හෝ වෙනයම් පසු අවස්ථාවකදී වැටුප් වර්ධක විලම්භනය හඳුනා ගැනීම හෝ සැලකීම හේතුවෙන් අදාළ උසස්වීම හෝ විභාගයේ ප්‍රතිඵල මත කෙරෙන පත්වීම හෝ වරප්‍රසාදය ලැබීම අත්හිටුවා ඇති නිලධාරීන් විසින් එම අත්හිටවූ පත්වීම් / වරප්‍රසාද ලබා ගැනීමට ඉදිරිපත් කරන අභියාචනා.

05. ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 01/2009 හි විධිවිධාන යටතේ එදිනට පෙර රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම විභාග සමත්වීම සඳහා විශාල අවස්ථා හයක (06ක) සහනයක් ලබා දී ඇති බැවින් එම සහනය ඉක්මවා මෙම චක්‍රලේඛ ය මගින් ඔවුනට සහන හිමි නොවේ.

06. ඔබගේ පහසු අවධානය සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට සහ II වන ශ්‍රේණියට අදාලව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වා ඇති දිනයන් පහත දක්වා ඇත.

| III ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වූ දිනයන් | II ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වූ දිනයන් | |
|---|---|---|
| | විභාග දිනයන් | ඒ.සේ.ච.ලේ.01/2009 මගින් පෙරදාතම් කර ඇති දිනය |
| 2007.03.31 | 2007.03.31 | 2005.01.01 |
| 2008.08.30 | 2007.12.08 | 2005.07.31 |
| 2009.07.26 | 2008.10.25 | 2006.01.31 |
| 2010.07.17 | 2009.11.21 | 2006.07.31 |
| 2011.10.01 | 2010.11.13 | 2007.01.31 |
| 2013.01.17 | 2011.12.24 | 2007.07.31 |
| 2014.06.29 | 2013.03.16 | |
| 2015.09.19 | 2014.05.10 | |
| | 2015.05.23 | |

ඒ.එච්.එම්. අන්සාර්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පරිපාලන),
නැගෙනහිර පළාත.

පිටපත්:-
1. ප්‍රධාන ලේකම්, නැගෙනහිර පළාත.
2. ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත.